# ACCOUNTING POLICIES, CHANGES IN ACCOUNTING ESTIMATES & ERRORS

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# ප්‍රමිතියට අදාළ නිර්වචන

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන නිශ්චිත මූලධර්ම, සම්ප්‍රදායන්, රීතීන් හා පරිචයන් ගිණුම්කරණ ප්‍රතිපත්ති වේ.

## ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම

වත්කම්, වගකීම් ආශ්‍රිත අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ හා බැඳීම් වර්තමානයේ දී පවතින තත්ත්වය අනුව තක්සේරු කිරීමේ දී වත්කමක හෝ වගකීමක ධාරණ අගය සඳහා අවශ්‍ය වන ගැළපීමක් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීමක් ලෙස හැඳින්වේ.

ClassWork.LK

# වැරදි

ගිණුම් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම අනුමත කළ අවස්ථාවේ පැවති සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී සැලකිල්ලට ගනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි තොරතුරු භාවිත නොකිරීම හෝ නියම ලෙස භාවිත නොකිරීම නිසා පෙර කාලපරිච්ඡේද එකක හෝ කිහිපයක අත්හැරීම් හා තොරතුරු සාවද්‍ය ලෙස දක්වා තිබීම වැරදි ලෙස හැඳින්වේ. උදාහරණ ඃ

- ගණිතමය දෝෂ
- ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කිරීමේ දෝෂ
- අතපසුවීම්
- කරුණු වැරදි ලෙස අර්ථකථනය
- වංචා

ClassWork.LK

## ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගන්නා ආකාර 2 කි.

1) **ගනුදෙනු හා සිද්ධීන් සම්බන්ධව ගිණුම්කරණ ප්‍රමිතයකින් දක්වා ඇත්නම් එම ප්‍රමිතයට අනුව**

2) **නිශ්චිත ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති නම් කළමනාකරණයේ විනිශ්චය මත**

## ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා

- **ගිණුම්කරණ ප්‍රමිතයක අවශ්‍යතාවක් මත.**
- **ආයතනයේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය හෝ මුදල් ප්‍රවාහ කෙරෙහි පෙරට වඩා විශ්වාසදායි ලෙස තොරතුරු සැපයීම සඳහා ප්‍රතිපත්ති වෙනස් කිරීම අවශ්‍ය විටෙක.**

ClassWork.LK

# ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීමේ දී ගිණුම්කරණ කටයුතු සිදු කරන ආකාරය

1) ලාභයට හෝ අලාභයට ගැළපිය යුතු ය.

   උදා : වෙළෙඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම

2) වෙනස බලපාන්නේ වෙනස සිදු වූ කාලච්ඡේදය හා ඉදිරි කාලච්ඡේදයට නම්, එම එක් එක් කාලච්ඡේදයේ ලාභයට/ අලාභයට ඇතුළත් කරමින් ප්‍රවර්තන වර්ෂයට හා අනාගත වර්ෂ සඳහා අදාළ වන පරිදි හඳුනා ගත යුතුය.

   උදා : දේපළ, පිරියත හා උපකරණ ප්‍රයෝජනවත් ජීවිත කාලය වෙනස්වීම මගින් වාර්ෂික ක්ෂය ප්‍රමාණය වෙනස් වීම.

ClassWork.LK

3) වෙනස වත්කම් හා වගකීම් වෙනස් වීමකට බලපාන්නේ නම් හෝ ස්කන්ධ අයිතමයකට සම්බන්ධ වන්නේ නම් එම වෙනස සිදු වූ කාලච්ඡේදයේ වත්කම්, වගකීම් හෝ ස්කන්ධ අයිතමයේ ධාරණ අගයට ගළපමින් වෙනස් වීම ගිණුම්ගත කළ යුතු ය.

ClassWork.LK

# හෙළිදරව් කිරීම් කළ යුතු ආකාරය

| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීම් | ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් | පෙර කාලච්ඡේද වැරදි |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීමේ ස්වභාවය | ඇස්තමේන්තු වෙනස් කිරීමට හේතු | පෙර කාලච්ඡේදයේ වරදෙහි ස්වභාවය |
| අනාගත හා ප්‍රවර්තන කාලච්ඡේදවලට සිදුවිය හැකි බලපෑම | ඇස්තමේන්තු වෙනස් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම | වැරදි නිවැරදි කර ඇත්තේ කවර කාලයක සිට කෙසේද යන්න පැහැදිලි විස්තරයක් |

ClassWork.LK

## අභ්‍යාසය

1) ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් හා වැරදි යන පද ගිණුම්කරණ ප්‍රමිතයට අනුව නිර්වචනය කරන්න.

2) ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේ දී සලකා බලන මූලික කරුණු දෙක ලියා දක්වන්න.

3) ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා දෙක ලියා දක්වන්න.

4) ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සටහන් කළ යුතු අන්දම පැහැදිලි කරන්න.

5) ප්‍රවර්තන වර්ෂයේ සිදු වූ වැරදි හඳුනා ගැනීමෙන් පසු ඒවා මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීමට පෙර නිවැරදි කළ යුතු බව සත්‍යාපනය කරන්න.

6) ගිණුම්කරණ ප්‍රමිතයට අදාළ හෙළිදරව් කිරීම් දක්වන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura